# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2021/2022

## PSC -4190 - ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රීකරණය

**කාලය : පැය දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට ( 03 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20 ).**

---

01. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පහත සංකල්ප වල ඇති වැදගත්කම සහ එම සංකල්ප එකිනෙක සම්බන්ධ වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.
    (අ) නිදහස
    (ආ) සමානාත්මතාවය, සහ
    (ඇ) මහජන ස්වාධිපත්‍ය (Popular Sovereignty).

02. (අ) හන්ටින්ටන් ට අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ පළමු සහ දෙවන 'ප්‍රතිලෝම රැලි '(Reverse Wave) සඳහා දායක වූ සාධක මොනවා ද?
    (ආ) ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට ඇති අභියෝග විමසා බැලීමේ දී ඉහත සාධක කෙතරම් වැදගත් වේද?

03. (අ) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කොමියුනිස්ට්වාදයෙන් වෙන්ව වෙනම මතවාදයක් ලෙස පරිණාමය වූ ආකාරය සාකච්ඡා කරන්න.
    (ආ) ප්‍රජාතන්ත්‍රවාදය සහ වෙළඳපොළ ආර්ථිකය අතර සම්බන්ධය තෝමස් මෙයර් ගේ න්‍යායාත්මක පැහැදිලි කිරීම මත පදනම්ව විභාග කරන්න.

04. (අ) සහයෝගීතා ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායේ (Consoiational Democratic Theory) ඓතිහාසික සංවර්ධනය සැකෙවින් සාකච්ඡා කරන්න.
    (ආ) ගැඹුරින් බෙදී ගිය බහුත්වවාදී සමාජවල පාලනය සඳහා සහයෝගීතා ප්‍රජාතන්ත්‍රවාදය නිර්දේශ කරනු ලබන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා *මහජන අරගලයේ* ඇති වැදගත්කම කුමක්දැයි අදාල න්‍යාය සහ සාක්ෂි භාවිතා කරමින් විවේචනාත්මකව විභාග කරන්න.

06. පහත දැක්වෙන මාතෘකා **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.

(අ) ආමන්ඩ්ගේ ප්‍රජාත්නත්‍රවාදී වර්ගීකරණය

(ආ) සමාජවාදී ජාත්‍යන්තරය (Socialist International)

(ඇ) නිශේදනීය නිදහස සහ සාධනීය නිදහස

(ඈ) බහුතරවාදී ප්‍රජාත්නත්‍රවාදය (Majoritarian Democracy) සහ සම්මුතිවාදී ප්‍රජාතන්ත්‍රවාදය (Conesus Democracy) අතර ඇති වෙනස්කම්.

*********************